The Journal of Studies in Humanities

Volume 5 (II) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යය ඇසුරින් මතු කෙරෙන පැරණි පිරිවෙන්වල පැවති ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම

**ඩබ්ලිව්. කේ. ඩී. කීර්තිරත්න**

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ

Email: wkdk1974@yahoo.com

**Abstract**

The main aim of this paper was to conduct an analytical and comparative study on teaching methods practised in ancient pirivena education in Kotte Kingdom. The comparative historical method has been used as the research method and Suttapitaka and epistles (Sandesha Kavya) written during Kotte period have been examined as primary sources to collect information. Research papers, articles and books written on monastery education and pirivena education were examined as secondary sources to collect data. Data has been analysed comparatively relevant to the comparative historical method. According to research findings it was shown that teaching methods practiced in pirivena education during Kotte period were very much similar to teaching methods used by teachers in the present day school system. In ancient pirivena they had practiced student centered teaching methods to enrich the outcome base education which was not second to the present outcome based education. Modern teachers can learn positive aspects of these ancient teaching methods for an effective learning teaching environment. Lessons learned by teachers from these traditional teaching methods would help them to reduce the gap prevailing between teachers and students due to less competencies displayed by teachers with poor teaching methods. Hence, it was suggested to conduct more subtle comparative studies on teaching methods in ancient pirivena education and modern schools for developing the insights of each other regarding the teaching methods.

**Keywords:** epistles, Kotte period, learning teaching process, traditional ancient pirivena education

### හැඳින්වීම

කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ දියුණුතම යුගය සේ සැලකේ. මෙම යුගයේ රචිත සන්දේශ කාව්‍යය ලාංකේය සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනයේ විවිධ පැතිකඩ පිළිබඳ වැදගත් තොරතුරු මතු කරයි. පරෙවි, සැළලිහිණි, ගිරා, කෝකිල සහ හංස යනු කෝට්ටේ යුගයේ දී ලියැවුණු සංදේශ කාව්‍යය වේ. මෙම සංදේශ අතරින් ගිරා සංදේශය හා හංස සංදේශය කෝට්ටේ යුගයේ පැවති සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී භාවිත කළ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ බොහෝ තොරතුරු ගෙනහැර දක්වයි. නමුත් පරෙවි, සැළලිහිණි හා කෝකිල යන සංදේශවල පැරණි බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් නොවේ. කෙසේවෙතත්, මෙම සංදේශවල අඩංගු බෞද්ධ අධ්‍යාපනය පිළිබද සඳහන් තොරතුරු පර්යේෂකයිනගේ අවධානයට ලක්විය යුත්තකි.

### පර්යේෂණ අරමුණ

මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය සේ සැලකෙන කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන්වල භාවිත කළ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ එකල ලියැවුණු පරෙවි, සැළලිහිණි, ගිරා, කෝකිල සහ හංස යන සන්දේශ කාව්‍යය ඇසුරෙන් සොයා බැලීමයි.

### පර්යේෂණ ක්‍රමවේදය

කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍යය දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් එම යුගයේ සාම්ප්‍රදායික බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ ලියැ වී ඇති පොත් පත් පර්යේෂණ පත්‍රිකා ද්විතයික මූලාශ්‍රය ලෙසත් යොදා ගෙන ඇත. මෙම මූලාශ්‍ර ඇසුරින් ලබාගත් තොරතුරු විස්තරාත්මකවත් සන්සන්දනාත්මකවත් ඇගයුම්ශීලීවත් ඉදිරිපත් කොට ඇත.

### සාහිත්‍යය විමර්ශනය

කෝට්ටේ යුගයේ ක්‍රියාත්මක වූ පැරණි පිරිවෙන් අධ්‍යාපනයේ දි විවිධ ක්ෂේත්‍රවලට අදාළ විෂයයන් උගන්වා ඇත (දායානන්ද, n.d.). එහිදි අධ්‍යාපනය හා සම්බන්ධ විශිෂ්ට ප්‍රගතියක් පෙන්නුම් කොට ඇත. මෙම පිරිවෙන්වල උභය සම්ප්‍රදායයන්ට අයත් සිසුහු අධ්‍යයන කටයුතුවල යෙදුණහ (අධිකාරි, 1991). උභය සම්ප්‍රදායය යනු ග්‍රන්ථ ධූරය හා විදර්ශනා ධූරයයි. වනගත පෙදෙසක භාවනා වැඩූ භික්ෂූහු විදර්ශනා ධූරයටත් ග්‍රාම වාසීව ත්‍රිපිටකය ඉගෙනීම, ඉගැන්විම හා දේශනා කළ භික්ෂූහු ග්‍රන්ථ ධූරයටත් අයත් වූහ (රාහුල, 1956). මෙයින් විජයබා පිරිවෙන ග්‍රාම වාසයට අයත් වන අතර පද්මාවතී පිරිවෙන හා වනරතන හිමි වනවාසය ට අයත් වේ. මෙයින් විශ්ව කීර්තියට පත් තොටගමුවේ විජයබා පිරිවෙන අග්‍රගන්‍ය ශාස්ත්‍රාලයකි (අධිකාරි, 1991). තොටගමුවේ විජයබා පිරිවෙන 18 වන සියවසේ යුරෝපයේ පැවති දියුණු විශ්වවිද්‍යාලයක තත්වයෙන් පවත්වාගෙන ගිය ශාස්ත්‍රාලයකි. සිරි පැරකුම්බා රජුගේ නොමඳ රාජ්‍ය අනුග්‍රහය නිසා තොටගමුවේ විජයබා පිරිවෙන ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක ස්වභාවය ගත් බව ඇතමෙක් අදහස් කරති (පුඤ්ඤසාර, 1992). මේ අතර

වනවාසයට අයත් සමහර පිරිවෙන්වල ලෞකික විෂයයනට කිසිදු ඉඩක් නොවූ අතර සමහර ඒවායේ පැවිද්දන්ගේ ප්‍රායෝගික පුහුණුවට එකග සම්ප්‍රදායානුකූල සම්මත විෂය පද්ධතියක් උගන්වා ඇත. මෙම ආයතනවල භාවිත කළ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම අනුව ගිහි පැවිදි දෙපක්ෂයේම ශිෂ්‍යයන්ට හික්මීම සහිත සංයමයක් ලබා දීම මුඛ්‍ය පරමාර්ථය කොටගෙන ක්‍රියාත්මක වූ බව පැහැදිලිය (දායානන්ද, n.d.).

## කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන් හා ඒවායේ ශාස්ත්‍රීය දියුණුව

කෝට්ටේ යුගය ශාස්ත්‍රීය දියුණුව අතින් ඉතා වැදගත් සංධිස්ථානයක් සටහන් කළ කාලසීමාවක් බව ඉහත තොරතුරුවලින් අනාවරණය වේ. මෙම යුගයේ පැවති පිරිවෙන් අතරින් කැරගල පද්මාවති පිරිවෙන වනරතන සංඝරාජ නාහිමියන්ගේ අධිපතිත්වය යටතේ ගොඩ නැගුණකි. මෙහි වනරතන හිමි ඇතුලු වැඩ විසි භික්ෂූන්ගේ ඇවතුම් පැවතුම් අනුව තීරණය කළ හැක්කේ කැරගල පද්මාවති පිරිවෙණ මහා විහාර සම්ප්‍රදාය අගයකරමින් එය රැක ගැනීමෙහිලා ඇපකැප වූ ආයතනයක් බවය. තොටගමුවේ විජයාබා පිරිවෙන මහාවිහාර සම්ප්‍රාදායත් මහායාන සම්ප්‍රාදායත් එකිනෙකට සම්බන්ධ කොට පවත්වා ගෙන ගිය ආයතනයකි. ගිරා සන්දේශ කතුවරයාට අනුව සංඝරාජ පදවිය ඉසිලූ තොටගමුවේ රාහුල හිමියන් (ක්‍රි. ව. 1467:1476) මෙහි පරිවේනාධිපති ධූරය දරා ඇත. තොටගමුවේ විජයබා පිරිවෙන ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ හික්කඩුවට නුදුරින් මාදම්පා ඔය තෙල්වත්ත ග්‍රාමයෙහි පිහිටියකි. 19 වන සියවස මැද බාගයට පෙර මෙම පිරිවෙන ඉතා ජනප්‍රිය අධ්‍යාපන මධ්‍යස්ථානයක්ව පැවතී ඇත. මෙහි ඉතිහාසය සොයන ඇතමෙක් පවසන්නේ තොටගමුවේ විජයබා පිරිවෙන අනුරාධපුර යුගයට අයත් වන අතර පසුව පළමුවන (1326) විජයබාහු රජු පස්මහල්ව කර වූ බවයි. තොටගමු වෙහෙර, රත්පත් වෙහෙර යනු විජයබා පිරිවෙන සඳහා භාවිතා කළ වෙනත් නම් දෙකක් වේ (ගිරා සංදේශය, 154). පරාක්‍රමබාහු රජු (1302) විසින් මෙය දෙමහල් කොට තනා ඇත. සන්දේශ කාව්‍යයවල සඳහන් බෙන්තොට වනවාසය 13 සියවසේ ප්‍රසිද්ධයට පත්ව තිබූ ආයතනයකි (අධිකාරි, 1991). ගලතුරුමුල මේධංකර සංඝරාජ නාහිමි හා ශ්‍රී මංගල සංඝරාජ නාහිමි පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙනෙහි පරිවෙනාධිපතිත්වය දරමින් එහි දියුණුවට කටයුතු කළහ. පැපිළියානේ සුනේත්‍රාදේවී පිරිවෙන ත්‍රිපිටකය, අටුවා, ටීකා ග්‍රන්ථකරණයට මුල් තැනක් දුන් ආයතනයකි (අධිකාරි, 1991). ඉරුගල් කුලතිලතක පිරිවෙන උභය වාසී මහ සගණ තෙවළා දහම් ප්‍රගුණ කළ ගලතුරුමූලට අයත් කේන්ද්‍රස්ථානයකි (අධිකාරි, 1991).

මේවායේ අධ්‍යාපනය වර්තමානයේ මෙන්ම විධිමත්, අවිධිමත් හා නොවිධිමත් ලෙස මනා සංවිධානයකින් පවත්වාගෙන ගොස් ඇත. සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්මය, අට්ඨකථා, ව්‍යාකරණ, ටීකා, ඡන්දස්, අලංකාර, තර්ක ශාස්ත්‍රය, තාරකා ශාස්ත්‍රය, සංස්කෘත, දෙමළ, වැනි විෂයයන් ශාස්ත්‍රීය විෂයමාලාවේ කොටස් ලෙස පවත්වාගෙන ගොස් ඇත. අධ්‍යාපන ආයතනවල අධ්‍යාපන පරිසරය ඉතා විධිමත් ලෙස සංවිධානාත්මක පවත්වාගෙන යාම තුළින් මෙම ආයතනවල අවිධිමත්, නොවිධිමත් විෂයමාලා ඉතා ශක්තිමත්ව පැවති බව තහවුරු කරයි (හංස සන්දේශය, 2015:157).

## ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම

වනපොත් කිරීම කැරගල පද්මාවති පිරිවෙනෙහි භාවිත කළ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයකි. එම පිරිවෙනෙහි සමහරු කච්චායන වුත්තිය සැක නැතිව වනපොත් කළහ. සන්දේශවල කසයින් යනුවෙන් දක්වන්නේ කච්චායන වුත්තියයි. කච්චායන නමැති භික්ෂුව විසින් ලියා තිබෙන පාලි ව්‍යාකරණ පොතට විස්තර සපයමින් ලියූ පොත කච්චායන වුත්ති නම් වේ. මෙහි විරිත යන්න වුත්ති යන්නෙන් බිඳගෙන ඇත (හංස සංදේශය, 2015:174). කටපාඩමින් උත්තර දෙම්හයි සමහරු නොයෙක් තැන්වල සිටිමින් වෛද්‍ය ශාස්ත්‍රය නැවත නැවත කී බව ගිරා සංදේශයේ දැක්වේ. නැවත නැවත කියැවීම යන්යට ''පිරිවහති'' යන යෙදුම භාවිත කරයි (ගිරා සංදේශය, 2014:225-226). අම්බලමේ කතා වැනුම නිර්මාණය කරන ගිරා සන්දේශ කතුවරයා කටපාඩම් කිරිම එකල එක් ඉගෙනීමේ හා ඉගැන්විමේ ශිල්පය ක්‍රමයක් වු බව රජතුමාව ඇගයීම සඳහා ශ්ලෝක නිර්මාණ කළවුන් ඒවා මිහිරිව කියා කටපාඩම් කළ බව පැවසිමෙන් තහවුරු කරයි (ගිරා සංදේශය, 2014:118). තොටගමුවේ විජයබා පිරිවෙනෙහි විසූ භික්ෂූන් සංඥා, සන්ධි, අර්ථ අත් නොහරමින් ව්‍යාකරණ කටපාඩම් කළ බව ද කියැවේ (ගිරා සංදේශය, 2014:118). මෙයින් සනාථවන්නේ සාමණේර භිකෂූන්, ළමුන් පමණක් නොව වැඩිහිටි අයද ඉගෙනුම් ක්‍රමයක් ලෙස වනපොත් කිරීම හා කටපාඩම් කිරීම භාවිත කොට ඇති බවයි. ඇතැමෙක් වනපොත් කිරිම හා කටපාඩම් කිරිම ඉගෙනුම් ක්‍රම දෙකක් නොව එකම ක්‍රමයක් බව පැවසුව ද මෙම ක්‍රම දෙක එකිනෙකට වෙනස් වූ ඉගෙනුම් ක්‍රම දෙකකි (Keerthirathne, 2020).

තමා උගත් දෙය ජීවිතයේ කොටසක් කර ගනිමින් එදිනෙදා ජීවිතයේ පවතින ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට වර්තමාන අධ්‍යාපනය මඟින් සිසුන් යොමු කරයි. මෙය ප්‍රයෝගික ක්‍රමය නම් වේ. මෙහිදී ශිෂ්‍යයා තමා විසින් ම අත්දැකිමෙන් ලබාගත් දැනුම උපයෝගි කරගෙන එදිනෙදා ජිවිතයේ මුහුණ දෙන ගැටලුවලට විසඳුම් සොයයි (ජයසේකර, 1971). ක්‍රියාවෙන් අවබෝධය, ක්‍රියාකාරි අධ්‍යාපනය, අභ්‍යාස ක්‍රමය යනුවෙන් ඇතැම්හු ප්‍රායෝගික ක්‍රමය හඳුන්වයි (නන්ද, 1999). නූතන දර්ශනිකයින් අතර රූසෝ, ඩිවි, මාරියා මොන්ටිසොරි වැනි අය මෙම ක්‍රමය ප්‍රවර්ධනය කළ අය වෙති. වර්තමානයේ භාවිත කරන ව්‍යාපෘති ක්‍රමයද ඩොල්ටන් ක්‍රමයද මේ හා සබැඳිය. ප්‍රයෝගික ක්‍රමය විජයා බා පිරිවෙනෙහි විසූ භික්ෂූනට නුපුරුදු දෙයක් නොවිය. ඔවුන් සතර අපාය අන්තර්ධානය කිරිමට සූත්‍ර ධර්මය ප්‍රගුණ කළ බව කියයි. න්‍යාය හා ප්‍රායෝගික භාවිතය යන දෙකම පැරණි බෞද්ධ අධ්‍යාපන ක්‍රමය හා බැඳී පැවතුනකි. ඒ අනුව මින් සනාථ වන්නේ ඇතැම් බටහිර අධ්‍යාපනික සංකල්ප නව දේවල් හැටියට මතු කිරීමට උත්සාහ ගත්ත ද ඒවා සාම්ප්‍රදායික පැරණි අධ්‍යාපනය තුළ දී වසර ගණනාවකට පෙර භාවිත කොට ඇති බවය.

ඇසීමෙන් දැනුම ගොඩනැගීමත් ඇසූ දෙය ධාරණය කරගැනීමත් අතීතයේ සිටම පැවතුනකි (හංස සංදේශය, 2015:179) වෛදික යුගයේ දී ශ්‍රැතිය ප්‍රධානතම ඥාණ මාර්ගය ලෙස සලකන ලදි. බුදු සමය ද ශ්‍රැතිය ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස භාවිත කරන නමුත් වෛදික ඉගැන්වීම්වලදී මෙන් ශ්‍රැතිය ඥාන මාර්ගයක් ලෙස ඇගයීමකට ලක් නොකළේ ය. ශ්‍රැතිය මගින් ලබා ගන්නා දැනුම නිවැරදි විය හැකිය. වැරදි විය හැකි ය. එසේම විය හැකි ය. එහෙයින් ඇසීමෙන් ඉගෙන ගන්නා දේ විමර්ශනයට භාජනය කරමින් දැනුම

ගොඩනැගිය යුතු බව බෞද්ධ ඉගැන්වීමයි (මජ්ඣිම නිකාය, II :322). "යහපත් වූ පිරිසිදු වූ පුරාණ ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් අත නොහැර දියමන්තියකට බඳු නුවණින් අවසානය දක්වා දැනගෙන මෝහන්ධකාරය දුරුකර මිහිරි වචනවලින් නිසැකව දේශනා කරන විසිතුරුවූත් ගැඹුරුවූත් අභිධර්ම පාඨවල අර්ථය, සමහරු අසා දැනගනිති" යන හංස සන්දේශ පදාර්ථයෙන් කෝට්ටේ යුගයේ අධ්‍යාපන මධ්‍යස්ථානවල ශ්‍රැතිය ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස භාවිත කළ ආකාරය පැහැදිලි කරයි. මෙහි දැක්වෙන ආකාරයට ශ්‍රැතිය මගින් ලබන දැනුම දියමන්තියක් වැනිය. එමගින් මෝහය නමැති අඳුර කපා දැමිය හැකිය. අතැඹුලක් සේ උගත් දේ භාවිත කිරීමට හැකි වන දැනුමක් ශිෂ්‍යයා ශ්‍රැතිය මගින් ලබා ගන්නා අයුරු මෙයින් තහවුරු කරයි. කුමන ඉගැන්වීම් ක්‍රම බටහිර අධ්‍යාපනය තුළින් හඳුන්වා දුන්න ද ඇසීම හා දෙසීම අද ද බහුලව භාවිත කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ශිල්පයක් වේ. ඇසීමෙන් ගොඩනගා ගත් අර්ධ සත්‍යය සහිත දැනුමක් ලබන වර්තමාන ශිෂ්‍ය පරම්පරාවට ශ්‍රැතියෙන් උගත් දේ අවසාන ඉගෙනුම් ඵලය කෙරෙහි ළඟාවීම දක්වා භාවිත කළ හැක්කේ කෙසේද ගන්න පැරණි පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය මගින් තහවුරු කරන අයුරු මෙම නිදර්ශන තුළින් පැහැදිලිය. ගුරුවරයාගෙන් අසා ඉගෙන ගත් දෙය ශිෂ්‍යයා විශ්ලේෂණාත්මකව උගත් බව ගිරා සන්දේස කතුවරයා තවදුරටත් පැහැදිලි කරයි. ඉගෙනුම් පල පාදක අධ්‍යාපනයක් සඳහා දේශන ක්‍රමය නිවැරදි ශිල්පිය ක්‍රමයක් ලෙස භාවිත කළ හැකි බව මින් තහවුරු වේ (ගිරා සංදේශය, 2014:221). දේශන ක්‍රමයේ අඩුපාඩු අවම කර ගැනීමට පහත සඳහන් ක්‍රමෝපායන් භාවිත කළ හැකි බව බෞද්ධ ඉගැන්වීම් ශිල්පීය ක්‍රම මගින් සනාථ වේ. ආධාරක භාවිතය (මා. නි. II: අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය), උපමා භාවිතය (මා. නි. III: 1382), රූපක භාවිතය (සු. නිඃ කසීභාරද්වාජ සූත්‍රය), කතන්දර භාවිතය (ම. නිඃ I: : 308), දේශනයෙහි මුල, මැද සහ අග පැහැදිලිව සම්බන්ධව කිරීම (මහාවග්ග පාලි, 19), දේශනයෙහි මාතෘකාව මුල දී ඉදිරිපත් කිරිම (ම.නි III : 256) සහ ප්‍රස්තුත අදහස කෙටියෙන් ඉදිරිපත් කිරිම (උද්දෙස) ප්‍රස්තුත අදහස විස්තරාත්මකව දැක්වීම (විභංග) (ම.නි, III .විභංග වග්ග: 398).

කතාන්දර ක්‍රමය සාරධර්ම ඉගැන්විම සඳහා අධ්‍යාපඥයින් යෝජනා කරන සාර්ථක ඉගැන්වීම් ක්‍රමයකි (කාරියවසම්, 1995). එමෙන්ම මෙය කාලාන්තරයක් තිස්සේ මිනිසා අතර පැවත එන ඉගැන්විම් ක්‍රමයකි. එවැනිවම මෙය ශිෂ්‍යයා උද්යෝගයෙන් ඉගෙනිමට පොළඹවන ක්‍රමවේදයකි (නන්ද, 1999). කතාන්දර ක්‍රමය පාසල් මට්ටමේදී ක්‍රම දෙකකට භාවිත කෙරේ.

01. ගුරුවරයා කතන්දරය කියවනවිට ශිෂ්‍යයින් අසා සිටිම.

02. ශිෂ්‍යයින් කතාව කියන විට ගුරුවරුන් අසා සිටිම.

ශ්‍රවණ ශක්තිය වර්ධනය විම, කෙනෙකුට සවන්දීමට ළමයාගේ ඉවසිමේ ගුණය දියුණු වීම, සබකෝලය නොමැතිවීම වැනි නිපුණතා කිහිපයක් කතාන්දර ක්‍රමය මඟින් සිසුන් තුළ වර්ධනය වේ. තවද අවසන් ද වනතුරු සිසුනගේ අවධානය අඛණ්ඩව පවත්වා ගැනීමට ද, ඉගෙනුම සඳහා ශිෂ්‍යා පොළඹවා ගැනීමට මුළු කාලච්ඡේදය පුරාම සොම්නස් සහගතව සිසුවා පාඩමෙහි රඳවා තබා ගැනීමට ද කතාන්දර ක්‍රමය යොදාගත හැකි ය. එවැනිව ම ගොස්ටොල්වාදීන් කතා කරන සමස්ත සංජනානය සම්බන්ධ මූල ධර්මයද මේ

තුළ අන්තර්ගතව පවතියි (නන්ද, 1999). බුදුරාජාණන්වහන්සේ කතන්දර ක්‍රමය භවිත කළ අයුරු (පායාසිරාජඤ්ඤ දි.නි) II: 1952 සහ කකචූපම, ම.නි I: 308) වැනි සූත්‍ර ඇසුරින් දත හැකිය. අම්බලමට එක් වූ විවිධ ජනයා ද කතාන්දර ක්‍රමය භාවිතයෙන් දැනුම ගොඩනගා ගත් අයුරු ගිරා සන්දේශ කතුවරයා පැහැදිලි කරයි (ගිරා සංදේශය, 2014:114). ''නොයෙක් කාව්‍ය නාටකාදි රස දත්තා වූ මිථ්‍යා දෘෂ්ටි ගත් අයෙක් පෙර තම තමන් උගත් රාම සීතා කතා කියත්'' යන්නෙන් එය පැහැදිලි වේ.

ගිරා සංදේශයට අනුව කෝට්ටේ යුගයේදී තේරවිලි භාවිතය ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයක් ලෙස යොදාගෙන ඇත. මෙය සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේදී මෙන්ම යාවජීව අධ්‍යාපන ක්‍රමයේදී ද භාවිත කර ඇත. අම්බලමේ කතා වැනුමේ දැක්වෙන ආකාරයට මානයෙන් යුත් ඇතමෙක් එක් එක් කෙනා හා තරග කරමින් වචනයෙන් වචනය තේරවිලි විසඳා කියති (ගිරා සංදේශය, 2014:115). සිත්නාම යනු තේරවිලි සඳහා ගිරා සංදේශ කතුවරයා භාවිත කළ යෙදුමයි. අම්බලමට රැස්වූ පිරිස් තම දැනුම වර්ධනය කරගැනීමට තේරවිලි යොදාගත් බව මෙයින් කියැවේ. කෝට්ටේ යුගයේ රචනා වූ දහම් ගැට මාලාව බෞද්ධ අධ්‍යාපනය තුළ දී තේරවිලිවලට හිමි වූ ස්ථානය කුමක්ද යන්න තවදුරටත් තහවුරු කරයි.

ආදර්ශනය වර්තමාන පාසල් පද්ධතිය තුළ ගුරුවරුනට ප්‍රගුණ කිරීමට උපදෙස් සපයන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයකි. ඇල්බට් බන්ඩුරාගේ සමාජ ඉගෙනුම් න්‍යායේදී සිසුවා අකෘති මගින් ඉගෙන ගන්නා බව කියයි. මෙම ආකෘති ඉගෙනුම පද්මාවතී පිරිවෙනෙහි ගුරුවරුනට හා ශිෂ්‍යයන්ට සුලබ අත්දැකීමක් වූ බව හංස සන්දේශ කතුවරයා සපයන තොරතුරු මගින් සනාථ වේ (හංස සංදේශය, 2015:174).

## සාරාංශය

කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන්වල වනවාසී හා ග්‍රාමවාසි යන සම්ප්‍රදායන් දෙකටම අයත්වූ භික්ෂූහු වැඩ විසූහ. භික්ෂූන්ට අමතරව ගිහි පිරිස් ද මෙහි අධ්‍යාපනය ලැබූහ. පිරිවෙන් අධ්‍යාපනයට අමතරව යාවජීව අධ්‍යාපනයද මෙම යුගයේදී ඉතාමත් දියුණු මට්ටමක පැවතුණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනාව සංවිධානය වී තිබූ මෙම පිරිවෙන්වල භාවිත කළ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම වර්තමාන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම වලට බොහෝ සෙයින් සමානය. වර්තමානයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම සඳහා භාවිත කරන ප්‍රායෝගික ක්‍රමය මෙම ආයතනවල ප්‍රධාන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයක් විය. මෙයට අමතරව අදටත් පැරණි සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ ආභාසය සහිතව භාවිත කෙරෙන වනපොත් කිරීම, කටපාඩම් කිරීම, ශ්‍රවණය, කතාන්දර භාවිතය, තේරවිලි භාවිතය ද ඉතා සාර්ථකව මෙම පිරිවෙන්වල යොදාගෙන ඇත. මෙකී සාම්ප්‍රදායික ඉගැන්විමේ ශිල්පීය ක්‍රම භාවිත කළ ආකාරය අධ්‍යයනය කිරීම මගින් වර්තමාන ගුරුවරුන්ටද උගත හැකි පාඩම් වන අතර වර්තමානය වන විට ඉගැන්විමේ ශිල්පීය ක්‍රම භාවිතයේ දී ගුරුවරු ප්‍රදර්ශනය කරන අඩු නිපුණතා මට්ටම් නිසා ගුරුවරයා හා ශිෂ්‍යයා අතර ගොඩනැගී ඇති හිඩැස අවම කර ගැනීමට ද විශාල මග පෙන්වීමක් කෙරෙනු ඇත.

## පරිශීලිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය


අංගුත්තර නිකාය. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල

ගිරා සන්දේශය. (2014). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

දීඝනිකාය. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල

මජ්ඣිම නිකාය. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල

මහාවග්ගපාලිය. (2005). සංස්කෘතික මධ්‍යාස්ථානය. නැදිමාල

සුත්ත නිපාතය. මංගල සූත්‍රය. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. නැදිමාල

සුමංගල විලාසිනි. (1926). සයිමන් හේවාවිතාරණ මුද්‍රණය

හංස සන්දේශය. (2015). (සංස්). සේනානායක. ජී. එස්. ඩී. ප්‍රදීප් මුද්‍රණය


### ද්විතීයික මූලාශ්‍රය


අධිකාරි, අභයරත්න. (1991). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟගණ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ

කාරියවසම්, සී. (1995). සාරධර්ම අධ්‍යාපනය. අධ්‍යාපනය, 25 කලාපය. කොළඹ විශ්වවිද්‍යාලය

ජයසේකර යු. ඩී. (1971). අධ්‍යාපන චින්තන. මෙට්‍රො ප්‍රින්ටර්ස්: කොළඹ

දායානන්ද, බිනරගම. (n.d.). කෝට්ටේ යුගයේ ශාස්ත්‍රීය නවෝදය. සීමාසහිත උපාලි පුවත්පත් සමාගම: කොළඹ. Retrived from **https://www.divaina.com/2012/05/16/badada03.html**

නන්ද, ඇකිරිගල. (1995). බුදුදහමින් පිළිබිඹුවන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම. චතුර මුද්‍රණාලය: වැල්ලම්පිටිය

පුඤ්ඤසාර, ජී. (1991). තොටගමුවේ පින්බිම. සම්භාෂා පළමු වෙළුම. තෙවන කලාපය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. නව සමගි මුද්‍රණාලය. කොළඹ.

Keerthirathne .W.K.D. (2020). An Analytical Study on Curriculum and the Learning Teaching Process in Pirivena Education in Sri Lanka. International Journal of Educational and Psychological Research. Volume 9, Issue 2, 60-64pp